මගේ අංකය: DSP./V8 /dri. බහු.කා.සහයකයින් ඒ.සේ.බඳවා.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.10.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බඳවාගනු ලැබ ඇති පුහුණු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඒකාබද්ධ රියැදුරු සේවයේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම**

අංක 22/1353/605/011 හා 2022.09.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරන ලද 2022.12.30 දිනැති තෙවන අතුරු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අංක PSC/EST/03-01-01/01/2022 හා 2023.09.27 දිනැති ලිපියෙන් දන්වන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බඳවාගනු ලැබ ඇති පුහුණු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින්, ඒකාබද්ධ සේවය යටතේ වන රියැදුරු සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන අතර එම ස්ථිර පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ඇති ඒකාබද්ධ සේවය යටතේ රියැදුරු සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද නිලධාරී කමිටුවේ අනුමැතිය ලබා තිබිය යුතුය.
2023.06.30 දිනට පසුව කාල පරිච්ඡේදය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම අනුමැතිය ලබා දී තිබිය යුතුය.

II. සේවා අවශ්‍යතාවය සහ වැටුප් හා දීමනා ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරවාගෙන පවතින බවට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑහීමකට පත්වීමෙන් පසුව අදාළ බඳවා ගැනීම් සිදු කළ යුතුවේ.

III. සියලු බඳවාගැනීම් 2022.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යා සීමාව තුළ විය යුතුය.

IV. **බඳවාගැනීමේ සුදුසුකම්**

දැනටමත් රියැදුරන් ලෙස පුහුණුවේ යෙදී සිටින / පුහුණුව සඳහා තෝරාගත් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින්ට මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි මෙම බඳවා ගැනීම සිදුකළ යුතු අතර එය ඉදිරියට පූර්වාදර්ශයක් නොවන පරිදි ක්‍රියාත්මක විය යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඒ අනුව, අංක **1875/39 හා 2014 අගෝස්තු මස 15 දිනැති රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා ඒකාබද්ධ රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ** සඳහන් සුදුසුකම් පරිදි පුහුණු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින්, රාජ්‍ය සේවයේ ප්‍රාථමික සේවා ශ්‍රේණියේ (PL 03) රියැදුරු තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගනු ලැබේ.

ඒ අනුව, බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක III ශ්‍රේණියට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා ඒකාබද්ධ රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ,

(අ) 7.2.2.2 හි වෘත්තීය සුදුසුකම්

(ආ) 7.2.2.3 හි පළපුරුද්ද

(ඇ) 7.2.2.4 හි කායික සුදුසුකම්

මෙම පත්වීම ලබා දෙන අවස්ථාවේදී සම්පූර්ණ කර තිබිය යුතුය.

එමෙන්ම, ඉහත සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 7.2.4.2 හි සඳහන් පරිදි ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථවාහන පරීක්ෂකයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත වෘත්තීය පරීක්ෂණ මණ්ඩලයක් මගින් සහ අංක 7.2.4.3 හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් තෝරා ගන්නා රියැදුරන් ලෙස පුහුණුව ලබන බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කළ යුතුය.

V. ඉහත සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරන ලද ස්ථිර පත්වීම් දිනය වන විට ද පුහුණුවේ යෙදී සිටින බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් සඳහා පමණක් රියැදුරු සේවයේ තාවකාලිකව පත්වීම් ලිපි ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ යුතුය. තාවකාලික පත්වීම් ලිපියේ ආකෘතිය මේ සමග අමුණා ඇත (ඇමුණුම 01).

එක් එක් නිලධාරියා වෙනුවෙන් වෙන වෙනම ගොනු සකස් කර විධිමත් පත්වීම් නිකුත් කිරීම සඳහා මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රය ද (ඇමුණුම 02) සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. ගොනු සැකසීමේදී ඇමුණුම 03 හි සඳහන් ලිපි ලේඛන වල **" සත්‍ය පිටපත් "** බවට සහතික කළ පිටපත්ද අමුණා එවිය යුතුය.

<u>සටහන</u>

**වයස අවුරුදු 45 ඉක්මවන පුද්ගලයන් සම්බන්ධ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා සිදුකළ යුතු බැවින් ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.**

02. ඒකාබද්ධ රියැදුරු සේවය සඳහා **ප්‍රියමනාප සේවා ස්ථාන** ලෙස සලකනු ලබන සේවා ස්ථාන සඳහා මේ යටතේ බඳවා ගැනීම් සිදු **නොකළ** යුතුය.

03. ඉහත සඳහන් ආකාරයට සුදුසුකම් සපුරා නොමැති පුහුණු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත විධිමත් පත්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බැවින්, තාවකාලික පත්වීම් ලබා දීමේදී අදාළ සුදුසුකම් සපුරා ඇති බවට **ඔබ පෞද්ගලිකවම** සෑහීමකට පත් විය යුතුවේ.

04. ඒකාබද්ධ රියැදුරු සේවයේ තනතුරු සඳහා පත්කිරීමට නියමිත මෙම බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් රාජ්‍ය සේවයේ සීමිත ධාරාව හෝ කුසලතා ධාරාව හෝ යටතේ උසස්වීම් ලබා ගැනීම සඳහා, රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා ඒකාබද්ධ රියැදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්ව තිබීම ඇතුළු සියලු අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සපුරාලීම අනිවාර්යය වන අතර, එසේ නොවන බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් කිසිසේත්ම කිසිදු බඳවා ගැනීමේ ධාරාවක් යටතේ PL මට්ටමෙන් ඉහළ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන බව ඔවුන්ට දැනුම් දිය යුතුය.

05. පුහුණුවේ යෙදී සිටින බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත (v) පරිදි තාවකාලික පත්වීම් ලිපි නිකුත් කර **එක් (01) මාසයක්** ඉක්ම යාමට පෙර විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා, අදාළ ලිපි ලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

**එස්. ආලෝකබණ්ඩාර**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන : 011-2694560
ෆැක්ස් : 011-2690100
විද්‍යුත් ලිපිනය : oes.pubad@gmail.com

**පිටපත** : අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව

**තාවකාලික පත්වීම් ලිපිය** ඇමුණුම 01

මගේ අංකය:-
............................ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව
කොළඹ.
2023. දින.

............................................................... මගින්,
............................................................... මහතා වෙත.
ජා.හැ.අංකය :- .......................................

**<u>ඒකාබද්ධ රියැදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම</u>**

අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-01-01/01/2022 හා 2023.09.27 දිනැති ලිපිය මගින් දන්වා ඇති අනුමැතිය ප්‍රකාරව ........................ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ ඒකාබද්ධ රියැදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරමි.

02. මෙය තාවකාලික පත්වීම් ලිපියක් වන අතර, නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් විධිමත් පත්වීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත. එසේ නොවන්නේ නම් මෙම පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

03. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලට හා කලින් කල ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝග වලටද, ඔබ යටත් විය යුතුය.

04. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,790 - 10 X 270 - 10 X 300 - 10 X 330 - 12 X 350 – 38,990/= කි. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධි විධාන අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළතදී ඒකාබද්ධ රියැදුරු සේවයේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ඔබ සමත් විය යුතුය.

05. **පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය.** කෙසේ වෙතත් පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීමේ බලධරයා හට ඒ සඳහා බලය ඇත.

06. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි යටතේ ඔබ මෙම තනතුර භාර ගන්නේද යන්නත් දෙසතියක් තුළ දී මා වෙත දන්වන්න. සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් පරිදි රාජකාරියට වාර්තා කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම පත්වීම අවලංගු වනු ඇත.

.........................................................
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන
මුද්‍රාව :-

**පිටපත** :- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**<u>බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බඳවාගනු ලැබ ඇති රියැදුරන් ලෙස සේවය කරන බහුකාර්ය සංවර්ධන සහායකයින් වෙත අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඒකාබද්ධ රියැදුරු සේවයේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>**

01. නම : ..........................................................................................................................................

02. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක් ☐

03. සේවක මහතා, බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බහුකාර්ය සංවර්ධන සහායක තනතුරට බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත ☐
පත්වීමේ දිනය [ Y Y Y Y / M M / D D ] හා තනතුර
.....................................................................

04. NVQ 3 පුහුණුව සම්පූර්ණ කර තිබේද? ඔව් ☐ නැත ☐

05. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු රියැදුරු බලපත්‍රයක් තිබේද? ඔව් ☐ නැත ☐
( පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ, බඳවා ගන්නා දිනට වසර 03කට පෙර නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් )
පැරණි ( C හෝ C1 වාහන පන්තියේ ) / නව ( B පන්තියේ )

06. වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබේද? ඔව් ☐ නැත ☐
( සහතික මගින් සනාථ කළ යුතුය )

07. ස්ථිර පත්වීම ලබා දීමට යෝජිත දිනට වයස අවුරුදු 45ට නොවැඩි බව? ඔව් ☐ නැත ☐

08. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.2.4 හි සඳහන් කායික සුදුසුකම් හා 7.2.2.5 හි සඳහන් වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබේද? ඔව් ☐ නැත ☐

09. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත

උපන් දිනය ........................... ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

ස්ථිර තනතුරට බඳවා ගන්නා අවස්ථාවේ ............................... දිනට වයස ............................

10. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත් ඇත ☐ නැත ☐

11. ශිෂ්‍ය කාර්ය දර්ශනය අනුව :- 8 ශ්‍රේණිය/ 9 වසර සමත්ද? ඔව් ☐ නැත ☐
සමත්වූ පාසල :- ..........................................................................................

12. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්( අමුණා ඇත ) ඔව් ☐ නැත ☐

13. බඳවාගැනීම 2022.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යා සීමාව තුළද? ඔව් ☐ නැත ☐

14. බඳවාගැනීම, රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද නිලධාරී කමිටුව / කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් ( 2023.06.30 දිනට පසු ) විසින් අනුමත කර තිබේද?

| ඔව් | නැත |
| --- | --- |
| | |

අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ PSC/EST/03-01-01/01/2022 හා 2023.09.27 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව සුදුසුකම් සපුරා ඇති / නොමැති බවට පෞද්ගලිකවම පරීක්ෂා කර සෑහීමකට පත්වන හෙයින් .................................. දිනට ඒකාබද්ධ රියැදුරු සේවයේ තනතුරකට පත් කිරීම නිරිදේශ කරමි. / නොකරමි.

............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

............................................................

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

**<u>බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බඳවාගනු ලැබ ඇති රියැදුරන් ලෙස සේවය කරන බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඒකාබද්ධ රියැදුරු සේවයේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>**

1. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සහතික කර නිකුත් කරන ලද උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
2. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත
3. ශිෂ්‍ය කාර්ය දර්ශනයේ සහතික කරන ලද පිටපත
4. අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපත ( පෙනීසිට ඇත්නම් පමණක් )
5. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුරට බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත
6. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව හෝ පුහුණුව ලද දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, බහුකාර්ය සංවර්ධන සහායක තනතුරෙහි මාස 06ක අඛණ්ඩ හා විධිමත් පුහුණු කාලයක් අවම වශයෙන් සම්පූර්ණ කළ බවට සහතිකය
7. NVQ 3 පුහුණුව සම්පූර්ණ කළ බවට සහතිකය
8. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව බඳවා ගන්නා දිනට වසර 03කට පෙර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයේ පැරණි - C හා C1 වාහන පන්තියේ හෝ නව - B පන්තියේ බලපත්‍රයේ සහතික කරන ලද පිටපත
9. සාමාන්‍ය පෙනීම, රාත්‍රී ඇස් පෙනීම සහ වර්ණ දෘෂ්ටිය පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද (සෞඛ්‍ය 307) විධිමත් සහතිකය
10. වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබීම සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික පත්‍ර වල සහතික කරන ලද පිටපත්
11. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්
12. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වාර්තාවේ සහතික කරන ලද පිටපත
13. ඔබ විසින් නිකුත් කරන ලද තාවකාලික පත්වීම් ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පිටපත
14. ඉහත තාවකාලික පත්වීම ( ඇමුණුම 01 ) අනුව නිලධාරියා වැඩ භාරගත් ලිපිය ( 5 පරිශිෂ්ටය ප්‍රකාරව )
15. බඳවාගැනීම, 2022.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යා සීමාව තුළ බවට සනාථ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කරන ලද තනතුරු අනුමත කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපත
16. රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද නිලධාරී කමිටුව විසින් / කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ( 2023.06.30 දිනට පසු ) ඔබ අමාත්‍යාංශයයේ / දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා දීමේ ලිපියේ සහතික කරන ලද පිටපත
17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය
18. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

**සැ:යු - සියලුම සහතික කරන ලද පිටපත් “ සත්‍ය පිටපත් ” බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය**